**ශීර්ෂය 176 - වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය**

**-------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

--------------

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 නොවැම්බර් 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ ව්‍යාපෘති 03 ක වැය විෂයයන් 23ක් සඳහා සලසා තිබූ රු.7,485,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයන් උපයෝජනය කර තිබූ ප්‍රතිපාදනය රු.4,495,486 ක් වූ අතර ඒ අනුව ඉතිරි ප්‍රතිපාදන රු.2,989 ,516 ක් විය. ඒ අනුව වැය විෂයයන් 23 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් වාර්තා වී තිබුණි. | 2020 වර්ෂයේ අතුරු සම්මත ගිණුම් 3 ක් යටතේ ප්‍රතිපාදන වෙන්කිරීම් සිදු වූ අතර වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවක් නිකුත් කිරීම සිදු වුයේ 2020 සැප්තැම්බර් මාසයේදීය. එමෙන්ම කොවිඩ් 19 වසංගත තත්ත්වයද හේතුවිය. එබැවින් නිසි පරිදි ඇස්තමේන්තු නොකිරීම නිසා මෙම ඉතිරිවීම් ඇතිව තිබූ බව ප්‍රායෝගික නොවන බව කාරුණිකව දන්වා සිටිමි. | මු.රෙ 50 හි සඳහන් ආකාරයට නිසි පරිදි ඇස්මේන්තු පිළියෙල කල යුතු බව. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂය සඳහා වූ රු.6,395,851 ක බැරකම් 2021 ජනවාරි හා පෙබරවාරි මාසයන්හිදී නිරවුල් කර තිබුණු අතර, මෙම වියදම් බැදීම් හා බැරකම් ප්‍රකාශයේ බැරකම් ලෙස හදුනාගෙන නොතිබුණි. තවද ව්‍යාපෘති තුනකට අදාලව වැය විෂයන් 17 ක ඉතිරිය ඉක්මවූ රු.4,192,277 ක් වූ බැරකම් වලට එළඹ තිබුණි. | අයවැය ලේඛන පිළියෙළ කිරීම මුල්‍ය පදනම මත සිදු කරන බැවින් බැදීම් හා බැරකම් ලෙස ගිණුම් තැබිමට හැකිවන්නේ ඉතිරි ප්‍රතිපාදන තිබේනම් පමණි. මුදල් පදනම මත පිළියෙල කරන අයවැය ලේඛණයේ ප්‍රතිපාදන ඉතිරියක් නොතිබේනම් උපචිත පදනම මත ගිණුම් පිළියෙල කිරිමට බැරකම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේ ප්‍රායෝගික ගැටළුවක් ඇත.<br>අයවැය පිළියෙළ කිරීම සිදුකරනු ලබන්නේ මුල්‍ය පදනම මත බැවින් ප්‍රතිපාදන සීමා ඉක්මවා අදාළ වර්ෂය තුල ගෙවීම් සිදු කර නැත. | මු.රෙ 94 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව බැරකම් වලට නොඑලඹිය යුතු බව. |

## 2.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

-------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයෙන් ස්ථාන මාරු වී ගිය නිලධාරින් 5 දෙනෙකුගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු.171,402 ක් වූ අතර මෙම ශේෂය වර්ෂ 16 කට වැඩි කාලයක් තිස්සේ අයකර ගත නොහැකිව ඉදිරියට ගෙන එමින් පැවතුණි. තවද, දිගු කලක සිට ඉදිරියට ගෙන එමින් පැවති වැඩ තහනම් කළ නිලධාරින්ගෙන් අයවිය යුතු රු.293,470 ක ණය ශේෂය හා සේවය හැරගොස් තිබුණු නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.21,140 ක ණය මුදල 2020 වර්ෂය අවසන් වන විටත් අයකරගත නොහැකිව තිබුණි. | ස්ථාන මාරු වී ගිය, නිලධාරින් 5 දෙනෙකුගෙන් අයවිය යුතු රු.171,403ක් වූ ණය ශේෂ කපා හැරිමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කරන ලද අතර එහි නිර්දේශය අනුව ණය ශේෂය කපා හැරිමට කමිටුවක් පත් කර කරුණු අධ්‍යයනය කර කමිටු වාර්තාව 2019.10.18 දින ඉදිරිපත් කරන ලදි.<br>වැඩ තහනමකට ලක්වී ඇති නිලධාරියාගෙන් අයවීමට නියමිත රු: 293,470 ක ණය ශේෂය, ඒ මහතාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් මහාධිකරණයේ පවරා ඇති නඩුවේ තීන්දුව මත සහ එම නිලධාරියා අභියාචනාධිකරණයේ ගොනුකර ඇති නඩුව සමතයකට පත්වී ඔහුට හිමි පාරිතෝෂිකය ගෙවීමට සිදුවුවහොත් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.<br>සේවය හැර ගොස් තිබූ නිලධාරියාගෙන් අයවිය යුතු රු: 21,140 ක මුදල අයකර ගැනීම පිළිබඳ ප්‍රගතියක් පෙන්වීම අපහසු බව දැන්වීමට කැමැත්තෙමි. | හිග ණය ශේෂ නිරවුල් කර ගැනිම සඳහා කටයුතු කල යුතු බව.<br>. |

## 2.4 ගණන්දීමේ නිළධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

-------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිළධාරි හා ගණන්දීමේ නිළධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු | අදස් දක්වා නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්,එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | | නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | මුදල් රෙගුලාසි 104 | වාහන 5ක අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104 පරිදි පරීක්ෂණයක් පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | බාහිර පාර්ශවයන්ට හානි සිදු වීමක් හෝ තුන්වන පාර්ශවයකට ගෙවීම් කිරීමක් සිදු කිරීමට සිදු වී නැති අතර වාහන අලුත්වැඩියා කර ගැනීමට අමාත්‍යාංශයෙන් ගෙවීම් කිරීමක් සිදුකර නොමැති හෙයින් මු.රෙ 104 පරීක්ෂණ සිදුකර නැත. කෙසේ වුවද ඉදිරියේදී සිදුවන වාහන අනතුරු සඳහා මු.රෙ 104 පරීක්ෂණ විධිමත් පරිදි පැවැත්වීමට කටයුතු කරන බව සඳහන් කරමි. | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| (ආ) | මුදල් රෙගුලාසි 136, 137 | නිර්දේශ කිරිම, බලය දිම හා අනුමත කිරිම එකම නිලධාරියකු විසින් සිදුකර රු.387,815 ක් වටිනා වවුචර් 2ක් සඳහා ගෙවීම් කර තිබුණි. | කොවිඩ් වසංගත කාලසීමාවක් නිසා මාණ්ඩලික නිලධාරීන් පවා සේවයට වාර්තා කලේ සීමිත ප්‍රමාණයක් බැවින් වවුචර් සඳහා නිර්දේශ කිරිම,බලය දීම, අනුමත කිරිම යන කාර්යයන් නිසි ලෙස සම්පූර්ණ කිරිමට නොහැකි වූ අතර සේවයට පැමිණි පසු සම්පූර්ණ කිරීම සඳහා දුරකතනයෙන්, එකගතාවය මත ගෙවීම සිදුකර එය සම්පූර්ණ කිරිමට සටහන් කර ගනිමි. | මුදල් ගෙවිමේදි මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| (ඇ) | මුදල් රෙගුලාසි 139 (10) (ii) | චෙක්පත් අංකය වවුචරයේ සටහන් කිරිමේදි අවස්ථා 2 කදී වැරදි චෙක්පත් අංක යොදා තිබුණි. | ජුනි මස අංක 64,65 වවුචර් දෙකෙහි චෙක් අංක මාරුවී සටහන් කර ඇති අතර, නිවැරදි කිරිමට කටයුතු කරන ලදී. | ගෙවීම් කරන නිලධාරියා විසින් චෙක්පත්වල සඳහන් අංක වවුචරයේ අංක හා සැසදෙන බව තහවුරු කර ගත යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 261(1) | අනුපිළිවෙලකින් තොරව අංක කළ ගෙවීම් වවුචර මුදල් පොතේ සටහන් කර තිබුණි. | ඉදිරියේදී පොතේ අනුපිළිවෙලින් අංක යොදා වවුචර් සටහන් කිරිමට වග බලා ගනිමි. | මුදල් පොතේ අනුපිළිවලින් වවුචර් අංක කල යුතු බව . |
| (ඉ) | මුදල් රෙගුලාසි 272(3) | 2020 වර්ෂයේ රු.800,983 ක් වටිනා ගෙවීම් වවුචර් 05 ක් 2021 මාර්තු 31 දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙවැනි ප්‍රමාද දෝෂයන් වලක්වා ගෙන කටයුතු කිරිමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | අදාල මාසය අවසන් වී සති 6 ක් ගතවීමට පෙර ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | මුදල් රෙගුලාසි 371(2) (ආ වගන්තිය) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදීමට ගණන් දීමේ නිලධාරියෙකුට හැකිවුවත්,අවස්ථා 2කදී රු.100,000 ක් හා රු.50,000 ක් ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන්ට අග්‍රිම ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය. | නිසි සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් අමාත්‍යාංශයේ හා වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ කටයුතු මුදල් ගෙවා මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශයේ සැපයිම් කටයුතු සිදුකරන ලද සැපයුම් සේවා නිලධාරී වෙත, ප්‍රධාන මුල්‍ය නිලධාරිගේ හා ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ සිදුකිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් අනුමැතිය ලබාදෙන ලදී. | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීමේදී මුදල් රෙගුලාසි හා පවත්නා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| (උ) | මුදල් රෙගුලාසි 371(5) හා 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | අවස්ථා 12 කදී ලබා දී තිබූ එකතුව රු.344,517 ක්වූ අතුරු අග්‍රිම පියවීම දින 24 සිට දින 327 දක්වා ප්‍රමාද කර තිබූ බව නිරීක්ෂණය විය. | ගරු ඇමතිතුමාගේ කාර්යාලයද වෙළඳ නාවික ලේකම් කාර්යාලයද ඇතුළුව අමාත්‍යාංශයේ වෙන් වෙන් වූ අංශ සඳහා අවශ්‍ය කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට විවිධ වියදම් දැරීම සඳහා නිලධාරින් කිහිපදෙනෙකු වෙත අග්‍රිම නිකුත් කර තිබුණි. | අතුරු අග්‍රිම ලබා දිමේ දි මුදල් රෙගුලාසි හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඵ) | 2018 ජනවාරි 17 දිනැති අංක 01/2018 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන නැව් ලියාපදිංචි කිරීම පැවරීම හා උකස් කිරීම, බඩු හා මගීන් ගෙන යන නැව් ගාස්තු, නැවියන් සේවයේ යෙදවීම ඉන් නිදහස් කිරීම හා නැවට සපයනු ලබන සේවාගාස්තු වැනි සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධන කාණ්ඩ 16කට අයත් ගාස්තු සංශෝධන කෙටුම්පතක් 2019 අගෝස්තු 05 දින මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි. එහෙත් 2021 මාර්තු 31 දින වන විටත් ඒවා නිරීක්ෂණ මට්ටමේ පැවතුණි. මෙම ගාස්තු වර්ෂ 15 කට අධික කාලයක් තිස්සේ සංශෝධනය නොවී පැවතීමෙන් සැලකිය යුතු රාජ්‍ය අදායමක් අහිමිව තිබුණි. | සේවා සම්පාදනයේදී අය කරනු ලබන ගාස්තු 15% කින් වැඩිකරමින් සකස් කරන ලද ගාස්තු සංශෝධන කෙටුම්පත 2018.02.12 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවකට ඉදිරිපත් කරන ලදී.<br>එම ගාස්තු සංශෝධන කෙටුම්පතට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් නොලැබුනි. එහෙත් වෙළඳ නාවික ලේකම් කාර්යාලය මගින් අයකරනු ලබන නැව් ලියාපදිංචි කිරීම හා ඒ ආශ්‍රිත ගාස්තු ශ්‍රී ලංකාවට ආසන්න අනෙකුත් රටවල අයකරන ගාස්තු සමග සංසන්දනය කර සකස් කල යුතු නිසා ඇතැම් ගාස්තු වැඩි නොකිරීමට සිදු වන නිසාත්, අයකරනු ලබන ගාස්තු වසර 10 කින් සංශෝධනය නොවීම නිසා 15% ඉක්මවා වැඩි කිරීමට අවස්ථාව ඇති නිසාත්, යෝග්‍ය පරිදි ගාස්තු සංශෝධන කෙටුම්පතක් සකස්කර ඉදිරිපත් කරන ලෙස රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් වාචිකව අප වෙත උපදෙස් ලබාදුනි.<br>ඒ අනුව ලේකම්ගේ අනුමැතියෙන් පත් කරන ලද කමිටුවක් විසින් නැවත ගාස්තු සංශෝධන කෙටුම්පත සකස්කර 2019.02.30 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම ගාස්තු සංශෝධන කෙටුම්පත පිලිබඳ සාකච්ඡාවක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එම සාකච්ඡාවේදී නාවික ක්ෂේත්‍රයන්ට අදාළ ආයතනයන්ගේ අදහස් හා යෝජනා ලබාගෙන නැවත සංශෝධන කෙටුම්පත ඉදිරිපත් කරන ලෙස භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් උපදෙස් ලබාදුනි.<br>ඒ අනුව අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් නාවික ක්ෂේත්‍රයට අදාළ ආයතනයන් සමග සාකච්ඡා පවත්වා එම ආයතනයන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට කටයුතු කරන ලදී. අඛණ්ඩ මුදාහැරීම් සහතිකපත් (CDC) හා ප්‍රවීනතා සහතිකපත් නිකුත් කිරීම, යාවත්කාලීන කිරීම හා අනු පිටපත් නිකුත් කිරීම වෙනුවෙන් සංශෝධනය කරන ලද ගාස්තු ඉහත ගාස්තු සංශෝධන කෙටුම්පතට ඇතුලත් කර ඇත. ඒ අනුව ඉහත ගාස්තු සංශෝධන කෙටුම්පතට අනුමැතිය ලබා ගැනීමෙන් පසු ගැසට් නිවේදනය පල කිරීමට බලාපොරොත්තු වේ. | 01/2018 හා 2018 ජනවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 වත්කම් කළමනාකරණය

------------------------------

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මූල්‍ය නොවන වත්කම් ලේඛණයෙහි සඳහන් පරිදි 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 15 ක් වටිනා කාර් රථ 04 ක් හා කැබ් රථ 02 ක් වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට 2020 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල ලබාදී තිබුණි. එහෙත් 2021 අප්‍රේල් 19 වන විටත් ඒවායේ අයිතිය විධිමත්ව පවරා දීමට කටයුතු කර නොතිබුණි. භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එම වාහන වල භාවිතය රාජ්‍ය අමත්‍යාංශය විසින් සිදුකරනු ලබයි. | රථ වාහන 6 ක් ගුදම් පහසුකම් , බහලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශායට අනුයුක්ත කර ඇත්තේ එම අමාත්‍යාංශය වාහන අවශ්‍යතා සපුරා ගන්නා තෙක් තාවකාලික පදනමින් වු හෙයින් එම වාහන වල අයිතිය එකී අමාත්‍යාංශය වෙත පවරාදී නොමැත. | 2017 දෙසැම්බර් 13 දිනැති අංක 259/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) | අමාත්‍යාංශයට අයත් වටිනාකම රු.60,000,000 ක් වූ මෝටර් රථයක් මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණු අතර ජනාධිපති ලේකම් කාර්යාලයට අයිති රු.10,500,000 ක් වටිනා මෝටර් රථයක් මූල්‍ය නොවන වත්කමක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන මූල්‍ය නොවන වත්කම් රු.49,500,000 ක් අඩුවෙන් නිරූපණය කර තිබුණි. | එක් මෝටර් රථයක් අධිකරණ අමාත්‍යාංශයේ වර්තමාන ලේකම් තුමා විසින් රාජකාරී ගමන් සඳහා රැගෙන ගොස් තිබු බැවින් මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණු අතර අනෙක් ජීප් රථය අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | විධිමත් ක්‍රියාපරිපාටින් අනුව වත්කම් පවරා ගැනිමට හා පවරා දිමට කටයුතු කල යුතු බව හා වත්කම් ලේඛන නිවැරදිව පැවැත්විය යුතු බව. |